**කොවිඩ් 19 සති පාසල සබරගමු පළාත.**
**නිවිතිගල අධ්‍යාපන කලාපය.**
**9 - ශ්‍රේණිය-පුරවැසි අධ්‍යාපනය-2021**

ඒකකය: 01 - සමාජ සුරක්ෂිතතාවය

සතිය: 01 වන සතිය (අප්‍රේල්)

ක්‍රියාකාරකම: සමාජ සුරක්ෂිතතාවය සඳහා දායක වන ආයතන හා ඒවායේ කාර්යභාරය විමසා බලමු.

හැඳින්වීම: සමාජ සුරක්ෂිතතාවය යනු සෑම පුද්ගලයෙකුටම බියෙන් හා සැකයෙන් තොරව ජීවත් වීමටත්, ජීවිතය යහපත් ලෙස පවත්වා ගෙන යාමටත් සමාජයෙන් හිමිවන රැකවරණය සහ ආරක්ෂාවයි. සමාජ සුරක්ෂිතතාවය ඇතිකිරීම සඳහා දායක වන ආයතන රාශියක් සමාජයේ දක්නට ලැබේ.

**ක්‍රියාකාරකම සඳහා සිසුන්ට උපදෙස්**

පෙළපොතේ 3-8 පිටු හොඳින් අධ්‍යයනය කරන්න.

පහත සඳහන් ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න.

1. සමාජ සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා පවුලකින් ඉටුවිය යුතු කාර්යයන් 5ක් සඳහන් කරන්න.
2. පවුල් සමාජයෙන් දරුවන් ඊළඟට පිවිසෙන්නේ පාසල් සමාජයටයි. සමාජ සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා පවුලට නොදෙවෙනි කාර්යභාරයක් පාසල මගින් ඉටු කරයි. ඒවායින් 5ක් සඳහන් කරන්න.
3. සෑම ආගමකම අරමුණ වන්නේ සාමයෙන් සමගියෙන් හා සහජීවනයෙන් ජීවත් වීමේ වගකීම ජනතාවට අවබෝධ කර දීමයි.ඒ සඳහා ආගමික ආයතන විසින් ඉටු කරන කාර්යයන් 5ක් ලියා දක්වන්න.
4. සමාජ සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා සමාජ ආයතනවල කාර්යයන් සඳහා උදාහරණ 5ක් සපයන්න.

සැකසුම - එන්.එම්. පී. කුමුදු කුමාරි

ර/නිවි/මීපාගම ජයන්ති මහා විද්‍යාලය

ර/නිවිතිගල අධ්‍යාපන කලාපය